නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව
අනුරාධපුර දිස්ත්‍රික්කය

---

1 . මූල්‍ය ප්‍රකාශන

-----------------

**1.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

**2017** වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් **28** දින සභාපතිවරයා වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර**,** මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ජූලි සහ අගෝස්තු මාසවලට අදාල උසාවි දඩ ආදායම රු.859,741 ක් ගිණුම්ගත නොකිරීම නිසා වර්ෂයේ ආදායම් සහ හිඟහිටි උසාවි දඩ ආදායම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2014 නොවැම්බර් මාසයේදී සභාවට ලබාදී තිබුණු ගැල්වනයිස් බට 696 ක වටිනාකම වූ රු.770,572 ක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම ගිණුම් ශේෂ එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) උතුරු නැගෙනහිර පළාත් පාලන සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ලබාදී තිබුණු රු.**43**,**690**,**895** ක් වූ ගොඩනැගිලි**,** ලී බඩු උපකරණ සහ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිවල වටිනාකමින් රු.24,228,699 ක ශේෂයක් ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුනු ගිණුම්

---------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ). සභාව විසින් නඩත්තු කරනු ලබන ප්‍රා.ස. වාර්තා සහ ලෙජර් ගිණුම් අතර රු1,472,413 ක නොසැසඳීම් පැවතුණි.

(ආ). සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාවර වත්කම්වල වටිනාකම රු.180**,**431**,**370 ක් වූ නමුත් ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීම ගිණුමේ ශේෂය රු.181**,**951**,**330 ක් වූයෙන් මෙම ගිණුම දෙක අතර රු.1,519,960 ක වෙනසක් පැවතුණි.

(ඇ) පොදු මුදල් පොතේ ගෙවීම් රු.47,372,105 ක් වුවත් වර්ෂයේ ගෙවීම් වැය එකතුව රු.47,615,190 ක් බැවින් රු.243,085 ක වෙනසක් පැවතුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙනයමින් පවතින වටිනාකම රු.26,794 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක් සහ එකතුව රු.811,017 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක් සමාලෝචිත වර්ෂය තුළද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණ අතර එම ශේෂයන්ගේ කාල විශ්ලේෂණයක් හා ශේෂ තහවුරු කරගැනීමට අවශ්‍ය තොරතුරුද ආයතනය සතුව නොතිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

-----------------------------------------------------

ගොඩනැගිලි ලේඛන, අයිතිය තහවුරු කිරීමට අදාල ඔප්පු /පැවරුම් ලේඛන, භෞතික වත්කම් යනාදී තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා රු.132,449,658 ක් වූ දිර්ඝකාලීනව පැවත එන ඉඩම් හා ගොඩනැගිලි ශේෂය විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

----------------------------------------------------------------------

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත<br>177 වගන්තිය | සභාවේ සේවය කරන තාවකාලික හා අනියම් සේවකයින් වෙනුවෙන් පාරිතෝෂික ගෙවීම් සඳහා වූ යෝජනා ක්‍රමයක් පිහිටුවීම පිණිස අතුරු ව්‍යවස්ථාවක් හඳුන්වා දීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) **1988** ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| **i.** රීති 5.11 | සභාව සතු මාර්ගස්ථ මුදල් සහ වෙනත් වටිනා භාණ්ඩ සම්බන්ධයෙන් නිසි ආරක්ෂණ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| **ii.** රීති 217 හා 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් P.S.46 ආකෘතිය ප්‍රකාර ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක **IAI/2002/02** දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සභාව භාවිතා කරන පරිගණක හා මෘදුකාංග පිළිබඳ වෙනම ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

2 මූල්‍ය සමාලෝචනය
---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,799,265 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,019,698 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | 2017 වර්ෂයේ බිල්කල ආදායම | 2017 රැස්කල ආදායම | | 2017 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම |
|---|---|---|---|---|---|
| | වටිනාකම | වටිනාකම | 2017.01.01 හිඟයෙන් වටිනාකම | 2017 බිල්කල මුදලින් වටිනාකම | වටිනාකම |
| | රු. | රු. | රු. | රු. | රු. |
| කඩකුලී | 79,085 | 387,000 | 67,300 | 317,100 | 81,685 |
| ටෙන්ඩර් | - | 702,075 | - | 657,443 | 44,632 |
| ව්‍යාපාර හා කර්මාන්ත බදු | - | 1,500,000 | - | 2,254,540 | - |
| වෙළඳ බලපත්‍ර | - | 175,000 | - | 254,937 | - |
| එකතුව | 79,085 | 2,764,075 | 67,300 | 3,484,020 | 126,317 |

2.2.2 වරිපනම්

----------

ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ දියුණු කල ප්‍රදේශවල පිහිටියාවූ යම් නිශ්චල හෝ චංචල දේපලක වාර්ෂික වටිනාකම මත වරිපනම් බද්දක් පනවා අයකිරීමට සභාව විසින් කටයුතුකර නොතිබුණි.

2.2.3 බදුකුලී

--------

සමාලෝචිත වර්ෂය අවසන් වන විට බදුකරුවන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.44,632 ක හිග බදු කුලී අය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 129 (2) (අ) වගන්තියට අනුව පළමුවන උප ලේඛනයේ සඳහන් කරන ලද හිග දඩ මුදල් රු. 1,741,619 ක් සහ 129 (2) (ආ) වගන්තියේ සඳහන් හිග මුද්දර ගාස්තු රු.27,705,950 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනය

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකලයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ සඳහන් කාරණා 28 ක් ඉටුකිරීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ **122** වගන්තිය ප්‍රකාර අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවත් උතුරු මැද පළාත් සභාව විසින් 2016 මාර්තු 30 දින ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද අංක 1960/35 දරන සම්මත අතුරු ව්‍යවස්ථා සභාව වැළඳගෙන ඇති බව 2017 ජුලි 28 දිනැති අංක 2030 දරන ගැසට් පත්‍රය මගින් පලකර තිබුණු නමුත් එම කර්තව්‍යයන් ගැසට් නිවේදනයේ උපදෙස් ප්‍රකාරව ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

---------------------

සභාව විසින් ඉටුකලයුතුව තිබුණු කර්තව්‍යන් වෙනුවෙන් 2014 ජනවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 1/2014 ප්‍රකාර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධ ප්‍රාදේශීය සභාව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග විගණනය වෙත වාර්තා කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛවල සඳහන් නිර්දේශ හා යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳව පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | චක්‍රලේඛ අංකය | නිර්දේශ අංකය | විෂයය | | අඩුපාඩු |
|---|---|---|---|---|---|
| (අ) | 09 | 07 | සුසාන භූමි | i. | සුසාන භූමි හා භූමදාන ස්ථාන, සුසාන භූමි හා භූමදාන ආඥා පනතේ විධිවිධාන යටතේ ප්‍රකාශයට පත් නොකිරීම. |
| | | | | ii. | සුසාන භූමිවල අයිතිය පිළිබඳ ලියවිලි සුරක්ෂිතව තබා ගැනීම ඇතුළු කාරණා 07 සම්බන්ධයෙන් දක්වා ඇති ක්‍රියාපිළිවෙල අනුව කටයුතු නොකිරීම. |
| (ආ) | 06 | 2.2(iii) | මාර්ග නඩත්තුව | | අඛණ්ඩව ක්‍රියාත්මක වන මාර්ග නඩත්තු ක්‍රමයක් ස්ථාපිත නොකිරීම. |
| | | 03 | | | සභාවට අයත් මාර්ගවල සීමා ගැසට් පත්‍ර මගින් ප්‍රකාශයට පත් නොකිරීම. |

(ඇ) දිවිනැගුම සංවර්ධන දෙපර්තමේන්තුව විසින් 2014 නොවැම්බර් 17 දින ලබාදෙනු ලැබූ රු.770,572 ක ගැල්වනයිස් කොඩි කණු 696 න් රු.582,358 ක් වටිනා කොඩි කණු 526 ක් අස්ථානගතවීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 සිට 108 ට දක්වා විධිවිධාන අනුව කටයුතු කර වගකිවයුත්තන් හඳුනා ගෙන අලාභය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග 2017 දෙසැම්බර් 31 දින දක්වා ගෙන නොතිබුණි.

(ඈ) ප්‍රතිපාදන නොසැලසීම

---

පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම අනුව සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් 04 ක් සඳහා රු.716,920 ක ප්‍රතිපාදන අනුමත කර තිබුණ නමුත් ඇස්තමේන්තුගත ආදායම් නොලැබීම නිසා එම ව්‍යාපෘති සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---

4.1 අයවැය පාලනය

---

නිසි පුරෝකථනයකින් තොරව අයවැය ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 04 ක අයවැයගත ආදායම් හා තත්‍ය ආදායම් අතර සියයට 37 සිට සියයට 112 දක්වා වූ පරාසයකින් යුක්ත විචලනයන් පැවතුණි. එමෙන්ම වියදම් විෂයයන් 06 ක අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 24 සිට 98 දක්වා පරාසයකින් යුක්ත විචලනයන් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.2 අභ්‍යන්තර විගණනය

---

අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර ඇතත්, අභ්‍යන්තර විගණනයක් සිදුකර විගණන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

4.3 විගණන හා කළමණාකරන කමිටු

----------------------------------------

2009 ජුනි 09 දිනැති අංක **DMA** 2009 (1) දරන කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත්කර තිබූ චක්‍රලේඛය ප්‍රකාර 2017 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි.

5 පද්ධති හා පාලනය

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ). | ආදායම් රැස් කිරීම. | **i.** දේපළ තක්සේරු නොකිරීම.<br>**ii.** නිවැරදි ආදායම් ඇස්තමේන්තු සකස් නොකිරීම.<br>**iii.** ආදායම් රැස් කිරීම කාර්යක්ෂම නොවීම. |
| (ආ) | සැලසුම් කිරීම | සංයුක්ත සැලැස්මක් ,ක්‍රියාකාරී සැලැස්මක්, ප්‍රසම්පාදන සැලැස්මක් සකස් නොකිරීම. |
| (ඇ) | ණයගැති /ණයහිමි පාලනය | **i.** කාල විශ්ලේෂණය පිළියෙල නොකිරීම.<br>**ii.** උපලේඛන පිළියෙල නොකිරීම.<br>**iii.** දීර්ඝ කාලීනව පැවත එන ශේෂ හඳුනාගෙන නිරවුල් නොකිරීම. |
| (ඈ) | ඝන අපද්‍රව්‍ය කළමණාකරනය | දිරාපත් නොවන ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට කටයුතු නොකිරීම. |